නමෝ බුද්ධාය


දාහ නව වෙනි වෙළුම
ආරම්භය: 2001-07-05

මාසික ධර්ම සංග්‍රහය අංක: 193

ශ්‍රී. බු. ව. 2560 | 2016-08-17 | නිකිණි කලාපය


# මෙත් සිතේ මහිමය


හෝකන්දර දකුණ සිංහපුර ශ්‍රී විජයානන්ද ධර්මායතනයේ

## අති පූජ්‍ය හබරකඩ ඉන්දරතන නාහිමිපාණන් විසිනි


නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ///

**"යේ කේචි පාණ භූතත්ථි - තසා වා ථාවරා වා අනවසෙසා**
**දීඝා වා යෙ මහන්තා වා - මජ්ඣිමා රස්සකාණුකථූලා**

**දිට්ඨා වා යෙව අද්දිට්ඨා - යෙ ච දූරෙ වසන්ති අවිදූරෙ**
**භූතා වා සම්භවෙසී වා - සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා"**

කාරුණික පින්වත්නි,

මෛත්‍රිය වැඩිය යුතු ආකාරය පැහැදිලි කරන වටිනා සූත්‍රධර්මයක් තමයි. කරණීය මෙත්ත සූත්‍රය. එම සූත්‍රයේ එක ගාථාවක් මා මුලින් මාතෘකා වශයෙන් සඳහන් කළේ. මා හිතනවා මුල් ධර්ම දේශනා වලින් මේ සූත්‍ර ධර්මය දේශනා කිරීමට හේතු වූ කරුණුත්, භාවනාවට සුදානම් වන්නන් තුළ තිබිය යුතු ගුණාංගත් මූලික වශයෙන් මෛත්‍රිය වැඩිය යුතු ආකාරයත් පැහැදිලි ව තේරුම් අරගෙන ඇති කියලා.

"සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා" කියලා භාවනා කරන කොට මේ "සබ්බේ සත්තා" - සියලු සත්ත්වයෝ කවුරුන්ද කියලා පැහැදිලි අරමුණු ගතයුතු වෙනවා. සත්ත්වාරම්මනය විග්‍රහ කිරීමයි. ඉහත සඳහන් කළ ගාථවෙන් කෙරෙන්නේ.

අදහස සම්පූර්ණ වෙන්න ගාථා දෙකම එකට අරගෙන තේරුම් කරන්න ඕන. සාමාන්‍ය සිංහල තේරුම මෙහෙමයි. "යම්කිසි ප්‍රාණ භූතයෝ තැතිගන්නා සුළු සත්ත්වයෝද, ස්ථාවර වූ සත්ත්වයෝ ද, දික් වූ සත්ත්වයෝද, මහත් වූ සත්ත්වයෝද, මධ්‍යම ප්‍රමාණ සත්ත්වයෝ ද, කොට සත්ත්වයෝ ද, ඉතා කුඩා සත්ත්වයෝද, මහත් ශරීර ඇති සත්ත්වයෝද. ඇසට පෙණෙන සත්ත්වයෝද, දුර වසන සත්ත්වයොද, නුදුරෙහි වසන සත්ත්වයෝද, හටගත් සත්ත්වයෝද, නැවත ඉපදීම සොයන සත්ත්වයෝද යන මේ සියලු සත්ත්වයෝ දුඛිතත්තා තභවන්තු - සුවපත් වූ සිත් ඇත්තෝ වෙත්වා."

මේ තමයි ඉතා දළ වශයෙන් ගත හැකි තේරුම. සියලු සත්ත්වයන් කවුරුන්ද යන්නයි. එක් එක් වචනවලින් හඳුන්වා දී තියෙන්නෙ.

සාරත්ථසමුච්චය අටුවාවේ කරණීය මෙත්ත සූත්‍රය පිළිබඳ විස්තරය දිහා ලැබුවා ම ථෙරවාදි මතය තමයි පැහැදිලි කෙරෙන්නේ. විශ්වයේ විවිධ ජීවීන් පිළිබඳ ව වුවත් සෑහෙන විග්‍රහයක් ඒ තුළින් දකින්න පිළිවන්. නූතන විචාරක මත අනුව බැලුවත් අටුවා මත බොහොමයක් ඉවත දමන්න පිළිවන් කමක් නැහැ. නූතන විද්‍යාඥයන් විශ්වයේ ජීවීන් ගැන කරන පර්යේෂණ ප්‍රතිඵල දිහා බාලුවා ම වසර දෙදහස් ගණනක් පැරණි බුදුසමයෙන් එළි දැක්වූ අදහස්වල අගය වඩාත් කැපී පේනවා.

දැන් අපි ගාථාවල එන ප්‍රධාන වචන අටුවාගත විස්තර ද ඇසුරින් සොයා බලමු.

**කසන්තිති තසා:-** බියවන හෙයින් තස නම් වූ සත්ත්වයන් කෙලෙස් සහිත සත්ත්වයන් තමයි. බියවනසුල්ලන් ලෙස හඳුන්වා තියෙන්නේ.

ථාවරා :- "පහීණ තණ්හා භයානං අරහතං එතං අධිවචනං තණ්හා" භය ප්‍රහීණ කළ හෙයින් රහතන් වහන්සේලා සඳහායි. ථාවර යන වචනය යොදා තියෙන්නෙ. දීඝාවානාභ පිඹුරු ආදි දීර්ඝජාතික සත්ත්වයන් ගොඩබිම වගේම පුදුම දීර්ඝජාතික සත්ත්වයන් මහ මුහුදෙත් වසනවා. මුහුදෙ වාසය කරණ යොදුන් ගණන් දිග නාග විශේෂයන් ගැන අටුවාවෙන් සඳහන් වෙනවා.

මහන්තාවා :- ගොඩබිම වසන හස්ති නාගාදි සත්ත්වයන්ද, දියෙහි වසන මහා මත්ස්‍යයන්ද, අමනුෂ්‍යයන් අතර දානවයවන් ද ආදී මහත් ශරීර ඇති අප්‍රමාණ සත්ත්ව විශේෂ මහත්තා යන වචනයෙන් ගැණෙනවා.

"මජ්ඣිමා :- අස් ගව මහිස සූකරාදි සත්ත්වයන් මධ්‍යම ප්‍රමාණයේ අය හැටියට හඳුන්වන රස්සකා - යන්නෙන් ගැනෙන්නෙ ඒ ඒ සත්ත්ව කොට්ඨාස වලට අයත් වාමනයන් කුරු සත්ත්වයන් **අණුකා පණු කුහුඹු ආදි කුඩාම සත්ත්වයන් ථූලා - ඉදිබු කැසටු ආදි වටකුරු සත්ත්වයන්.**

දිඨා :- තමන්ගේ ඇසට පෙණෙන සත්ත්වයන් අද්දිට්ඨා - ඇසට නොපෙණෙන මහ මුහුදින් එතෙර හෝ පිටසක්වල වල වසන සත්ත්වයන් **දූරේ වසන්ති අවිදූරේ** - දුර සහ ලඟ වසන අපාද ද්විපාද සත්ත්වයන් මින් ගැණෙන බව අටුවාවේ සඳහන් වෙන අතරේ අන්තනො කායෙ වසන්තා සත්තා අවිදූරේ තමන්ගෙ කයෙහි වසන සත්ත්යටන් නුදුරු අය හැටියටත් **බහි කාය තො වසන්තා දූරේ - සිරුරින්** බැහැර වසන සත්ත්වයන් දුර වසන අය හැටියටත් දක්වා තියෙනවා. දුර - අවිදුර වචන දෙක තවත් විවිධ ලෙස හඳුන්වා තියෙනවා. තමන්ගේ ගෙදර - ගමේ - ජනපදයෙ - ද්විපයේ - සක්වළෙහි වසන අය නුදුරේ වසන අය හැටියටත්, වෙනත් සක්වලවල් වළ වසන සත්ත්වයන් දුර වසන අය ලෙසත් දක්වා තියෙනවා. නූතන සෙයා ගැනිම් අනුව වඩාත් තහවුරු වන මෙවැනි අදහස් විචාරශීලීව තේරුම්ගත යුතු වෙනවා.

ඉහත ගාථාවල සඳහන් පරිදි තවත් වැදගත් වචන දෙකක් තියෙනවා. **භූතායෙව භූතා න පුන භවිස්සන්තිති සංඛං ගච්ඡන්ති තේසං ඛීණාසවානමෙතං** අධිවචනං භූතා යන්නෙන් රහත් අය ගැණයි කියැවෙන්නේ නැවත හටගැනීමක් නැති අය - නූපදින අය සියලු කෙලෙස් නසා සංසාර ගමන කෙළවර කළ හෙයින් නැවත උපතක් නැති අයයි.

**සම්භවෙසි** යන වචනය අටුවාව තෝරන්න **අප්පහීන භවංසයෝ - ජනත්තා ආයතිම්පි සම්භව එසෙත්තානං සෙඛ - පුථුජ්ජනා නමෙතං අධිවචනං** සංසාර බන්ධන සංයෝජන ප්‍රහීණ නොකළ නිසා නැවත උත්පත්තිය සොයන සෙඛ සහ ප්‍රථුජ්ජන සත්ත්වයන් මෙයින් ගැණෙනවා. භූත සම්භවෙසි යන වචන දෙකින් තවත් සත්ත්ව කොට්ඨාශ රාශියක් බෙදා දක්වා තියෙනවා. ඒ මේ කිසිවෙකු චුතියට හා ප්‍රතිසන්ධියට අතර සිටින්නන් ලෙස හඳුන්වා දි නැහැ. බිත්තර වලින් හා මවුකුසින් බිහි වීමේ අපේක්ෂාවෙන් සිටින අය සම්භවෙසි න් ලෙසත්, ඉන් බිහි වූ අය භූතයින් ලෙසත් හඳුන්වා තියෙනවා. සංසේදජ - ඕපපාතික සත්ත්වයන් ප්‍රථම චිත්තක්ෂණයේදී සම්භවේසි නම් වෙනවා. දෙවන චිත්තක්ෂණයේදී භූත නම් වෙනවා. මේ ආදි වශයෙන් තමයි අටුවාව මේ වචන දෙක හඳුන්වා තියෙන්නේ මේ සියලු හැඳින්වීම් වලින්ම අපේක්ෂා කර තියෙන්නේ විශ්වයේ වසන සියලු ජීවීන්ම ගැනෙන ලෙස සබ්බේ සත්තා යන්න විග්‍රහ කිරීමටයි. කිසිවෙක් අත් නොහැරන ලෙස සියලු සත්ත්වයන් කෙරේ මෛත්‍රිය පැතිරවිය යුතු ආකාරය පැහැදිළි කිරීමටයි.

විශ්වය ගැනත් ජීවීන් ගැනත් පුළුල් විග්‍රහයක් මේ තුළින් මතු වෙනවා. බුද්ධකාලීන දඹදිව තලයෙහි බොහෝ දෙනා විශ්වාස කළේ ලෝකය කියන්නේ ජම්බුද්වීපය ම ලෙසයි. ඒ තරම්ම ලෝකය ගැන දැනුම පටුවෙලයි තිබුණෙ. අද ලෝකය ගැන නොවෙයි ඊටත් බෙහෙවින් පුළුල් වචනයක් වන විශ්වය ගැනයි පරීක්ෂණ කෙරෙන්නේ කෙළ ලක්ෂ ගණන් (කෝටි සත සහස්සෙසු චක්කවාළෙසු) සක්වලවල ජීවීන් ගැනයි. බුදුරජාණන් වහන්සේ දේශනා කළේය. එහෙම නම් ඒ සියලු සක්වළවල් සුඛිත (සැප ඇති දිව්‍ය ලෝක) දුක්ඛිත (දුක්බර අය වසන අපාය) යන වර්ග දෙකට බෙදා තියෙනවා. සුඛිත අයගෙ වාසභූමින් විවිධයි. අප්‍රමාණයි. දුක්ඛිත අයගේ වාසභූමින් අප්‍රමාණයි විවිධයි. මේ පෘථිවියෙන් එහා වෙනත් ජීවීන් වසන ස්ථාන ගැන බුදුදහමෙන් තමයි අපට මුලින්ම තොරතුරු දැනගන්න ලැබුණෙ. නිර්මාණවාදීන් දුටුවේ එකම දෙව්ලොවක් එකම අපායක් හා එකම මිනිස් ලොවක්. බුදුසමය අනුව ඒවා අප්‍රමාණයි. ඒ අප්‍රමාණ සත්ත්වා වාසවල අනන්ත අප්‍රමාණ සත්ත්වයන් අරමුණු කොට ගෙන මෙත් වැඩිය යුතු ආකාරය ඉහත ගාථා දෙකේ සඳහන් වී තියෙනවා.

විශ්වයේ අප්‍රමාණ ජීවීන් ගැන දේශනා කළා වගේම ක්ෂුද්‍ර ජීවීන් ගැනත් බොහෝ දෙනා නොදුටු කරුණු බුදුදහමින් අනාවරණය කර තියෙනවා. නූතන විද්‍යානුකූලව සොයා බලන විට පිරිසිදු වතුර වීදුරුවක ඒ මේ අත ගමන් කරන ක්ෂුද්‍ර ජීවීන් අප්‍රමාණ ගණනක් දැකගන්න අපට පුළුවන් වෙන්නේ සියුම් දේ දකින යන්ත්‍රයකින් (සූක්ෂම දර්ශීකයකින්) පමණයි. පියවි ඇසට ගෝචර වෙන්නෙ නැහැ. අඟලක් තරම්

ඉඩකඩක මෙවැනි කුඩා ජීවීන් දහස් ගණනක් තැබිය හැකි වෙනවා.

ඉතා කුඩා නිසා අපේ ඇසට නොපෙණුනත් ජලයෙ පමණක් නොවෙයි පොළොවෙත් වාතයෙත් අසංඛ්‍ය ගණන් ක්ෂුද්‍ර ජීවීන් ඇති බව ශාස්ත්‍රඥයොත් සොයාගෙන තියෙනවා. මේ සියලුම ප්‍රාණීන් ඇතුළත්වන ලෙසයි. බුදු සමයෙ එන මෛත්‍රී සංකල්පය ගොඩනැගි තියෙන්නේ. කිසිම ප්‍රාණියෙකු අප වෙනුවෙන් පහළවී නැහැ. අපේ කුසගින්න නිවන්නට නොවෙයි. හේතු ප්‍රත්‍යය අනුවයි විශ්වයේ ජීවීන් පහළවෙන්නේ.

අපේ උත්සාහය විය යුත්තේ කිසිම ජීවියෙකුට හිරිහැරයක් නොවන ලෙස ක්‍රියා කිරීමයි. ක්‍රියාත්මක කළ නොහැකි දැඩි ප්‍රතිපත්තියක් බුදුසමයෙ නැහැ. සිතට මුල්තැන දෙන සරල ප්‍රතිපත්තියක් තුළින් මිනිසාගෙ ජීවිතයට බාධා නොවන ලෙස කටයුතු කර ගැනිමට මග පාදා තියෙනවා.

විශ්වයේ ජීවීන් පිළිබඳ ප්‍රශ්නය වගේම අන්තරාභවය පිළිබඳවත් විවිධ තර්ක විතර්ක තියෙනවා. විශේෂයෙන් මේ සූත්‍රයේ එන "සම්භවේසී" යන වචනය සමහරුන් යොදාගෙන තියෙන්නේ අන්තරාභවයක් ඇතැයි පෙන්නීමට එහෙත් එම සූත්‍ර අටුවාව දක්වන හැටියට බිත්තරයකින් එළියට ඒමට බලා සිටීම, මව් කුසින් නික්මවීමට බලාසිටීම පහ නොකළ සංයෝජන ඇති නිසා නැවත නැවත ඉපදීම සොයන යන අර්ථ සම්බවේසි යන්නට දී තිබෙනවා මිය චුතියට හා ප්‍රතිසන්ධිය අතර පවත්නා අවස්ථාවක් හැටියට ගැනීමට ථෙරවාදී න්‍යායයෙන් ඉඩක් ලැබෙන්නෙ නැහැ.
කෙසේ නමුත් මෙලෙස විවිධ ආකාරයෙන් හඳුන්වා දෙන ලද සියලුම සත්ත්වයෝ කිසිවෙකු අත් නොහැර සුවපත් වූ සිත් ඇත්තෝ වෙත්වා.

**ඔබ සැමට සම්මා සම්බුදු සරණයි !**